Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2022 දෙසැම්බර් 16, කොළඹ

## නෙස්ටොමෝල්ට් 'අරමුණට ශක්තියක්' වැඩසටහන ශ්‍රී ලාංකේය දිරිය මව්වරු 1,000කගේ අරමුණු බලගන්වයි

නෙස්ලේ නෙස්ටොමෝල්ට් හි 'අරමුණට ශක්තියක්' යනු, වර්තමාන සමාජ ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද තම පවුල්වල ප්‍රගතිය සහතික කිරීම සඳහා දැඩි කැපවීමකින් යුතුව ක්‍රියාකරන දිවයින පුරා සිටින දිරිය මව්වරුන්ගේ නොපසුබට උත්සාහය සහ කැපවීම ඇගයීමේ වැඩසටහනකි. නෙස්ලේ ලංකා හි ප්‍රමුඛතම සන්නාමය වන නෙස්ලේ නෙස්ටොමෝල්ට්, ශ්‍රී ලාංකේය පවුල්වල අභිලාෂයන් සවිබල ගැන්වීමේ ප්‍රයත්නයක් ලෙස එවැනි මව්වරුන් 1,000කට මාස 3කට ප්‍රමාණවත් නෙස්ලේ නෙස්ටෝමාල්ට් නිෂ්පාදන බෙදා දීමට පසුගියදා පියවර ගත්තේය.

2022 සැප්තැම්බර් මාසයේදී දියත් කරන ලද මෙම වැඩසටහන ඔස්සේ, නෙස්ලේ නෙස්ටොමෝල්ට් සිය පාරිභෝගිකයින්ගෙන්, ඔවුන් හඳුනන දිරිය මව්වරු නම් කරමින් සමාජ මාධ්‍ය හරහා ඔවුන්ගේ ආදර්ශමත් කතාව බෙදා ගන්නා ලෙසට ආරාධනා කරන ලදී. එම ඇරයුමට දිවයිනේ සිව්කොණින්ම පාරිභෝගිකයින්ගෙන් අතිමහත් ප්‍රතිචාරයක් ලැබුණු අතර, ඒ අතරින් තෝරාගත් දිරිය මව්වරු 1,000කට මෙසේ ත්‍යාග පිරිනමන ලදී.

"පරම්පරා ගණනාවක් පුරා ශ්‍රී ලාංකීය පවුල්වල ආදරය දිනාගත් සන්නාමයක් වන නෙස්ලේ නෙස්ටොමෝල්ට් හරහා, ඔවුන්ගේ පවුල්වලට ශක්තිය සපයන දිරිය මව්වරුන්ට අපගේ සහයෝගය ලබා දීමට හැකිවීම ගැන අපි සතුටු වන්නෙමු. මෙය, අප සියලු දෙනාටම දුෂ්කර කාලයක් බැවින්, නොසැලෙන අධිෂ්ඨානයක් පවත්වා ගැනීම අතිශයින්ම වැදගත් වේ. එබැවින්, අභියෝග මධ්‍යයේ තම පවුලේ අරමුණු බලගැන්වීමේ උත්සාහය ඉදිරියට ගෙන යාමට දිරිය මව්වරුන් ධෛර්යමත් කරන අතරම, ඔවුන්ගේ ආදර්ශමත් කතා තුළින් ධනාත්මක බව ව්‍යාප්ත කිරීමට මෙම වැඩසටහන උපකාරී වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කිරි ආහාර අංශයේ උප සභාපති රුවන් වැලිකල මහතා පැවසුවේ ය.

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. මෙරට වෙළෙඳපොළේ පවතින නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කෙරේ. නෙස්ලේහි ප්‍රමුඛතම සන්නාමයක් වන නෙස්ටොමෝල්ට් යනු වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය සහ ආදරය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටොමෝල්ට්, ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරය වන අතර, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, වෙනත් අත්‍යවශ්‍ය පෝෂ්‍ය සංඝටකවලින් ද සමන්විත ය.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |